# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/10 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2017 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 2037/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) 1984 ජනවාරි මස 24 වැනි දින අංක 281/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලය පිහිටුවමින් ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද, නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය '' යන අයිතමයට අනුරූපීව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''8. ඉංග්‍රීසි භාෂා සහ වාග් විද්‍යා අධ්‍යයන අංශය '' යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''9. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය''.

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

07 -791

1A - PG 4111 — 508 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*